**ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම - 2020**

**------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මතය

**------**

ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ ප්‍රකාශනය සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම

**--------------------------------------------------------**

2013 මූල්‍ය වර්ෂය තුළදී සමාගම විසින් විදුලිය බෙදා හැරීම සඳහා යටිතල පහසුකම් සැපයීමේ මූලික ව්‍යාපාරික ක්‍රියාකාරකම නවතා දැමූ බව දැක්වෙන 2.1 සටහන වෙත අවධානය යොමු කරවමි. සමාගම 2020 දෙසැම්බර් 31 දිනට රු. 25,633,704 (2019 - රු. 26,009,910) ක සමුච්චිත අලාභයක් වාර්තා කරන ලද අතර වර්ෂය තුළ සමාගමේ බදු පෙර ලාභය රු. 427,507 (2019 - බදු පෙර ලාභය රු. 141,146) ක් විය. 2020 දෙසැම්බර් 31 දිනට සමාගමේ සෘණ ශුද්ධ වත්කම් තත්ත්වය රු. 632,704 (2019 – රු. 1,008,910) ක් වූ අතර 2020 දෙසැම්බර් 31 දිනට සමාගමේ ශුද්ධ ජංගම වගකීම් තත්ත්වය රු. 632,704 (2019 - රු. 1,008,910) ක් විය. තවද, සමාගමේ ශුද්ධ වත්කම් එහි ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් අඩකටත් වඩා අඩු වූ බැවින්, 2007 අංක 07 දරන සමාගම් පනතේ 220 වගන්තියට අනුව ප්‍රාග්ධන තත්ත්වය බරපතළ පාඩු ලබන තත්ත්වයකට පත් වී ඇත.

2013 වසරේ සිට සමාගම සිය මූලික ව්‍යාපාරය නවතා දමා ඇති හෙයින්, වාර්තා කරන දිනට ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින අතර එමඟින් සමාගමේ අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් සැකයක් ඇති විය හැකිය. කෙසේ වෙතත්, සමාගමේ මව් සමාගම වන සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම ප්‍රමාණවත් මූල්‍ය ආධාරයක් ලබා දී තිබුණු අතර එමඟින් සමාගමට තවදුරටත් අඛණ්ඩ පැවැත්මක් සහිත සමාගමක් වශයෙන් ස්වකීය මෙහෙයුම් කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට හැකි වී තිබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.5 විගණන විෂය පථය

--------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳාපවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට , වරදක් නිසා සිදුවන .මාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේප්‍ර බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර ,ජ ලේඛන සැකසීමව්‍යා ,දුස්සන්ධානය , ,චේතනාන්විත මඟහැරීමවරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ .

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්න්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ අභ්‍ය , .කාශ කිරීමට අදහස් නොකරයිමතයක් ප්‍ර

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 376,206 ක ලාභයක් වූ අතර ඉකුත් වර්ෂයේ ඊට අනුරූප ලාභය රු. 141,146 ක් විය. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ රු. 235,060 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනය සඳහා ප්‍රධාන හේතුව වූයේ කලින් ලියා හරින ලද ණයගැති ශේෂය ලැබීමය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට සමාගමේ කොටස් ප්‍රාග්ධනය රු. 25,001,000 ක් වූ අතර මුළු කොටස් ප්‍රාග්ධනය සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම විසින් ආයෝජනය කර තිබුණි. සමාගම විසින් විදුලි කණු නිෂ්පාදන ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ 2012 වර්ෂයේදීය. කෙසේ වුවද, තත්ත්ව පරීක්ෂණ කටයුතු සිදු කිරීමට නොහැකි වීම හේතුවෙන් සමාගම විසින් විදුලි කණු නිෂ්පාදනය නතර කරන ලද අතර 2020 දෙසැම්බර් 31 දිනට සමාගම විසින් රු. 25,633,704 ක සමුච්චිත පාඩුවක් වාර්තා කර තිබුණි. පසුගිය වර්ෂ කිහිපය තුළ සමාගමේ කිසිදු මෙහෙයුමක් නිරීක්ෂණය නොවූ අතර කළමනාකාරිත්වය මගින් සමාගම පවත්වාගෙන යාමට සඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සමාගම 2008 වර්ෂයේ දී ව්‍යාපාරය ආරම්භ කරන ලදී. 2008 සිට 2011 දක්වා සමාගම ලාභ වාර්තා කර තිබුණි. කෙසේ වුවද, යම් තාක්ෂණික දෝෂ හේතුවෙන් විදුලි කණු නිෂ්පාදනය අසාර්ථක විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2012 සිට 2015 වර්ෂය දක්වා සමාගම පාඩු ලබන ලදී. 2016 වසරෙන් පසුව, පාඩුව අවම කිරීම සඳහා කුඩා කාර්යය සිදු කිරීමට කළමනාකාරිත්වය මගින් තීරණය කළ අතර සමුච්චිත පාඩු අවම කිරීම සඳහා කුඩා කාර්යය කිහිපයක් සිදු කරන ලදී. කෙසේ වුවද, මේ වන විට සමාගම විසින් අස්තිත්වයක් වශයෙන් ව්‍යාපාර කටයුතු මෙහෙයවීම සඳහා සුළු ලාභයක් ලබා ගන්නා අතර ඉහත වාතාවරණය හේතුවෙන් සමුච්චිත රඳවා ගත් පාඩුව රු. 25,633,704.00 ක් විය. | සමාගමේ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත සහ උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය රු. 5,159,044 ක් වූ අතර මෙම වත්කම් සියල්ල 2013 වර්ෂයේ සිට නිෂ්ක්‍රිය වී තිබුණි. | මෙහෙයුම් කටයුතු සිදු කිරීමට නොමැති බැවින්, මෙම වත්කම් භාවිතා නොකෙරේ. කෙසේ වුවද, මෙම සියලු වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබේ. | වත්කම්වල ප්‍රයෝජනවත් ජීව කාලය නැවත තක්සේරු කර සමාගමේ මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 අනුව, වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම ලැබී නොතිබුණි. | චක්‍රලේඛ අවශ්‍යතාව පරිදි වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුය. |

### 4.2 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජූනි 02 දින නිකුත් කරන ලද අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 ඡේදයට අනුව, ව්‍යවසායයේ අනාගත දිශානතිය සම්බන්ධ ක්‍රමෝපාය සංයුක්ත සැලැස්මෙහි ඇතුළත් වේ. මෙම අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කිරීමට සමාගම අපොහොසත් වී තිබුණි. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම ලැබී නොතිබුණි. | සමාගම චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |